වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩුව

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රමුඛතම ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට ප්‍රසන්න පෞරුෂයකින් හෙබි ක්‍රියාශීලී සහ ප්‍රතිඵල දිශානත පුද්ගලයන් සොයයි.

### විශ්ලේෂක තනතුර II ශ්‍රේණිය - JM (1-1)

**රැකියා පිරිවිතරය**

මණ්ඩලයේ අදාළ රසායනාගාර ඒකකයේ කළමනාකරුවන් /ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් රාජකාරි ඉටු කිරීමට අතිරේකව සහ පහසුකම් සැලසෙන පරිදි රසායනාගාරයේ තේ සාම්පලවල සියලුම විශ්ලේෂණ කටයුතු.

### තත්ත්ව කළමනාකරණ නිලධාරි II ශ්‍රේණිය - JM (1-1)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ අදාළ රසායනාගාර ඒකකයේ කළමනාකරුවන්/ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් රාජකාරි ඉටු කිරීමට අතිරේකව සහ පහසුකම් සැලසෙන පරිදි රසායනාගාර තත්ත්ව පරිපාටීන් සහ යහපත් රසායනාගාර භාවිතයන්ට අදාළ වෙනත් ක්‍රියාකාරකම්.

**විශ්ලේෂක සහ තත්ත්ව කළමනාකරණ නිලධාරි තනතුරු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්:**

අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍ර ජීව විද්‍යාව (විෂයන් අතරින් එකක් ලෙස) සහිත විද්‍යාව පිළිබඳ උපාධියක්

සහ

රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක (ISO 17025 බලයලත්) රසායනාගාරයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

අ) ඉහත අයදුම්කරුවන්ට අවශ්‍ය වන සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාව :** **JM 1-1 - 2016** : රු. [42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580]

අදාළ මූලික වැටුප් පියවර වන්නේ රු. 42,600/= කි. මීට අමතරව, රු. 7,800/= ක ජීවන වියදමක් සහ රු. 5,000/= ක විශේෂ දීමනාවක් ද ගෙවනු ලැබේ.

**විශ්ලේෂක සහ තත්ව කළමනාකරණ නිලධාරි තනතුරු සඳහා තෝරා ගැනීම :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

අයදුම්කරුවන් විසින් විශ්ලේෂක සහ තත්ත්ව කළමනාකරණ නිලධාරි තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රතිලාභ**

- මණ්ඩලයේ පවතින නීතිරීතිවලට අනුව වෛද්‍ය ප්‍රතිලාභ.
- අර්ථසාධක අරමුදල: තෝරා ගත් අයදුම්කරුවන් විසින් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතුය. මණ්ඩලය 15% කින් දායක වන්නේය.
- මණ්ඩලය සේවකයාගේ වැටුපෙන් තවත් 3% ක් සේවක භාර අරමුදලට දායක කරනු ඇත.

**පොදු කොන්දේසි**

- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- සෑම අයදුම්කරුවෙකුටම විශිෂ්ට චරිතයක් තිබිය යුතුය.
- තෝරාගත් බාහිර අයදුම්කරුවන් වැඩ භාරගත් දින සිට වසර තුනක (03) පරිවාස කාලයක් මත පත් කරනු ලැබේ. දැනටමත් තහවුරු කර ඇති අභ්‍යන්තර අපේක්ෂකයින් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.
- ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ විධිවිධාන අනුව බාහිරව බඳවා ගන්නා පුද්ගලයින් අදාළ වැටුප් පරිමාණයේ මූලික වැටුප් පියවරට ද අභ්‍යන්තරව පත් කරන පුද්ගලයන් වැටුප් පරිමාණයට ද පත් කරනු ලැබේ.

**අයදුම්පත්**

මෙම නිලධාරියාගෙන් ලබාගත හැකි හෝ අපගේ වෙබ් අඩවිය වන **http://www.srilankateaboard.lk** වෙතින් බාගත කරගත හැකි නියමිත ආකෘතියට අනුව අයදුම්පත සකස් කළ යුතු අතර, එම අයදුම්පත උප්පැන්න සහතිකයේ පිටපතක්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද තහවුරු කෙරෙන ලේඛනවල පිටපත් සමග වමත් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ ලියුම් කවරයක බහා **2023 අප්‍රේල් 25** දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

දැනට රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලු පාර,
කොළඹ 3.